**විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන - 2022**

**විශිෂ්ටතම ගේය කාව්‍ය සංග්‍රහය**

**(විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2022හි, වසරේ විශිෂ්ටතම ගේය කාව්‍ය සංග්‍රහය පිළිබඳ විනිශ්චය ඉදිරිපත් කළ අවසන් තීරකයාගේ නිරීක්ෂණ සටහන් ඇතුළත් දේශනය ආශ්‍රයෙන් සකස් කරන ලද්දකි.)**

මුලින්ම 2022 විදෙශ්‍යාදය සාහිත්‍ය සම්මාන ප්‍රදානයේ විශිෂ්ටතම ගේය කාව්‍ය සංග්‍රහය සඳහා නිර්දේශිත ග්‍රන්ථවලට අයත් නිර්මාණ පිළිබඳ පොදුවේ ඉතා කෙටි අදහසක් මම ඔබ හමුවේ තබනවා. ඉන් පසු අද සාහිත්‍ය සම්මානයට පාත්‍රවන කෘතියෙහි විශේෂත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරනවා.

මෙම අගැයීමේදී සිදු කෙළේ ගේය පදවල පවත්නා ආකෘතිය, අන්තර්ගතය හා එයට අමතරව සමාජ සංස්කෘතික වටිනාකම් අන්තර්ගත වන ආකාරය, ඒ එකිනෙක සංකලනය වී ඇති ආකාරය ගවේෂණය කරමින් නිර්මාණ කාර්යයෙහි වටිනාකම් හඳුනා ගැනීමට උත්සාහ කිරීමයි.

අවසන් වටය සඳහා නිර්දේශිත කෘති පහත සඳහන් පරිදි වේ.

ප්‍රේමයයි මනරම්: යමුනා මාලිනී පෙරේරා (සරසවි ප්‍රකාශකයෝ)

පමා වී පිපුණු මල් සුවඳයි: වසන්ත කුමාර කොබවක (කර්තෘ ප්‍රකාශන)

සඳ මඩල වී: පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි (සූරිය ප්‍රකාශකයෝ)

විවිධ භාව ප්‍රකාශන මගින් තේමා උද්දීපනය කිරීම සඳහා විවිධ රිද්මානුගත පද සංයෝජන සිදු කිරීමේ ලක්ෂණය මෙම කෘති තුනෙහිම දක්නට ලැබෙනවා. සොබාදහම, මානව හැඟීම්, සමාජය ඈ කරුණු ආශ්‍රිත දැනුම්වත්භාවය කුඩා ගේය පද රචනයක සියුම් ලෙස රැඳවීමේ හැකියාව මෙම නිර්මාණ මගින් පැහැදිලිව නිරූපණය කොට තිබෙනවා. සියුම් අදහස් ප්‍රකාශනයේදී නිර්මාණාත්මක ප්‍රඥාවෙන් විපුල ප්‍රයෝජනය ලබා ගැනීමේ නිපුණතාව මෙම බොහෝ පද රචනාවලින් මැනැවින් පිළිබිඹු වෙනවා. පොදුවේ මෙම ගේය පද සංග්‍රහ තුනෙහිම අන්තර්ගත නිර්මාණ සිතකට ආලෝකයක් ගෙන දීමෙහි සමත්. අරුත්බර අදහසක් සැපයීමෙහි සමත්.

ඇතැම් විට ප්‍රබල මනෝ භාව උත්පාදනය කරමින් රසිකයා මානව හිතවාදී හැඟීමෙන් කම්පනයට පත් කළ හැකි පද බැඳුම් මෙම කෘතිවල අන්තර්ගත වෙනවා. නිදසුනක් ලෙස

හිරුගෙ කිරණ සැඩ වුණාට

සඳුගෙ සිහිල දුර වුණාට

මං ඉන්නම් තරුවක් වාගේ

උදෑසනට පහන් තරුව සේ

සවසට ඉරබටු තරුවක් සේ (පමා වී පිපුණු මල් සුවඳයි කෘතියෙන්)

දැන් පහත සඳහන් රචනය බලන්න.

සදාදරේ මල් සුවඳේ මාසිත සතපා

ජීවිතයේ දුක් සුසුමන් නුඹ පලවනවා

ඒ සුවයෙන් මා පොළොවේ පාද තබනවා (ප්‍රේමයයි මනරම් කෘතියෙන්)

යමෙකුට මිනිස්කමේ ආදරණීය අසිරිය කොතරම් සංවේදීව විඳගත හැකිද යන කරුණ මෙවැනි නිර්මාණවල ගැබ් වී පවතිනවා.

ජීවිතයේ යථාර්ථය පිළිබඳ ලියැවුණු දාර්ශනික ගේය කාව්‍යයද මේ අතර පවතිනවා. නිදසුනක් ලෙස,

මේ රැයත් දිගු රැයක් නින්ද ළඟපාත නැති

නොසන්සුන් ඔබෙ හිතත් තාම නිදි නැතුව ඇති

සංසාර මාවතේ තනි නූන කෙනෙක් නැති (සඳ මඬල වී කෘතියෙන්)

විශිෂ්ට ගේය පද රචනාවක පැවතිය යුතු සොඳුරු මතක පද ලෙස සිතක රැඳෙනු ඇතැයි සිතිය හැකි පදවලින් සමන්විත ගීතද මේ අතර පවතිනවා. ඔබට මතකද එවැනි ජනප්‍රිය පද? මේ එක් එක් කෘති ලියූ අතින්ම ලියැවුණු එවැනි මතක පද කිහිපයක් පහත දැක්වෙනවා.

සුළඟ නුඹ වගේ, අතීතය සිහිනයක් පමණයි, මොනර කිරිල්ලී.

කෙසේ වෙතත් විවිධ භාව රූප මැවීමෙහි සමත් පදවල රිද්මීය විවිධත්වය කෙරෙහි තවත් අවධානය යොමු වූයේ නම් ඇතැම් රචකයන්ගේ නිර්මාණවල වර්ණවත්භාවය තවත් වැඩි වන්නට ඉඩ තිබුණා. එමෙන්ම ඔවුන් විවිධ තේමා ප්‍රතිනිර්මාණය කිරීමේදී යොදා ගන්නා මූලාශ්‍රය මෙයට වඩා පුළුල් පරාසයක් වෙත ගෙන යාමේ හැකියාව පවතිනවා. පද මාලාව සංයෝජනය කිරීමේ හැඩතල තවදුරටත් නිර්මාණාත්මක ඉසවු කරා ගෙන යාමේ හැකියාවද පවතිනවා. එම කරුණට අනුව ඇතැම් රචනාවලින් නිරූපිත තේමාත්මක ධ්වනිය ඉදිරිපත් කිරීමේ යම් ඒකාකාරි රටාවක් නිරූපණය වෙනවා. එහෙත් තනි නිර්මාණ ලෙස සැලකීමේදී එයම නිර්මාණ ශෛලිය සඳහා රචකයාට ස්වාධීන වර්ණයක් ගෙන දීමෙහි හේතු වන බවටද යමෙකුට තර්ක කළ හැකියි.

දැන් මා ඔබට ඉදිරිපත් කරනවා 2022 විද්‍යෝදය සාහිත්‍ය සම්මානයට පාත්‍ර වන ගේය පද සංග්‍රහයේ විශේෂත්වය පිළිබඳව කෙටි සන්සන්දනාත්මක විවරණයක්. මා මුලින් සාරාංශගත කළ කරුණු අතුරින්

සාර්ථක ලක්ෂණ යැයි කිව හැකි කරුණු වඩාත් උත්කර්ෂවත් ලෙස සමස්ත නිර්මාණ කාර්යය පුරාම පාහේ විහිදී තිබෙනු දක්නට ලැබෙන කෘතියයි එම විශිෂ්ටතම කෘතිය වන්නේ.

මෙම කෘතිය ගේය කාව්‍ය රචනයෙහි අනුගමනය කළ ප්‍රතිනිර්මාණාත්මක තාක්ෂණ විධික්‍රම හා කාව්‍ය ආකෘති පිළිබඳව කියන විට, බොහෝ ප්‍රබන්ධවල දක්නට ලැබෙන රචනා ලීලාව විවිධ අවස්ථෝචිත මං පෙත් ඔස්සේ ගමන් කරමින් උකහා ගන්නා ලද රමණීය නාද රිද්ම සංයෝජනයකින් අලංකරණය වූවක්. නොයෙක් විරිත් ලක්ෂණ ඔස්සේ යමින් අවස්ථානුකූලව සංස්කරණය කරමින් රිද්ම ගළපා ගැනීමේ සූක්ෂ්මාත්මතාව ප්‍රශස්තයි. වරෙක සඳස් සම්ප්‍රදායයට අනුගත වෙමින්ද, වරෙක නිසඳස් සම්ප්‍රදායය අනුගමනය කරමින්ද, තවත් වරෙක ඒවායෙහි සුසංයෝගයෙන්ද මැවූ ගායනෝචිත රිද්ම රටා මනරම්. තේමානුරූපී ශබ්ද රසයක් ඉස්මතු වන පරිදි වචන තෝරා ගැනීම, අනුප්‍රාස භාවිතය, රිද්මීය විවිධත්වය හා විචිත්‍රත්වය ජනිත කරවීම සඳහා වූ නිර්මාණකරුවාගේ ලාලසාව මෙම නිර්මාණවලින් මැනැවින් ප්‍රකට වෙනවා.

මෙම කෘතියෙහි ඇතුළත් සෑම නිර්මාණයකම පාහේ අන්තර්ගත සමාජ-සංස්කෘතික අනුභූති ප්‍රතිනිර්මාණයේදී භාවිත රචනා ආකෘති හා භාෂාව අප බොහෝ තැන්වල සුලබව අද්දකින නිර්මාණ රටාවලට වඩා වෙනස් වූ යම් සුවිශේෂ ස්වරූපයකින් පවතිනවා. තේමාත්මක නව්‍යත්වය පිළිබඳ සැලකීමේදී සාම්ප්‍රදායික ජනශ්‍රැති, සම්භාව්‍ය සාහිත්‍යය, ජනප්‍රිය සංස්කෘතික පසුබිම් ඈ විවිධ මූලාශ්‍රය ඇසුරෙහි මෙන්ම සොබාදහමෙහි වස්තූන් හා සිදුවීම් ආදියද චිත්තාකර්ෂණීය පද නිපැයුම් හා නිර්මාණාත්මක විලාසිතාවන්ට අනුව සිදු කොට ඇති පද සංයෝජන මගින් සංකල්පගත කොට ප්‍රතිනිර්මාණය කැරෙන ආකාරය මෙම කෘතියෙහි පෙනෙන්නට තිබෙනවා. මේ හේතුව නිසා තේමාවේ රසවත්භාවය උදෙසා වචන සංයෝග කිරීමේ ස්වාධීන අනන්‍යතාවක් මෙම ගේය පද සංග්‍රහයේ ඇතුළත් නිර්මාණවල කැපී පෙනෙන අයුරින් දක්නට ලැබෙනවා.

මෙම කෘතියේ අන්තර්ගත බොහෝ රචනා හෝ ඇතැම් විට සියල්ල මුලින් පද ලියා පසුව ගායනය කළ ඒවා. එම නිර්මාණ සියල්ලම පාහේ ගේය පද රචනයක පැවතිය යුතු විශිෂ්ට ලක්ෂණයක් වන "තනු නිර්මාණය ප්‍රබල භාව ප්‍රකාශනයක් වෙත ගෙන යාම සඳහා ආමන්ත්‍රණය කිරීමේ" සහජ ගුණයෙන් යුක්ත වන බව පැවසිය හැකියි. මේ සියල්ලක්ම ගීත ලෙස ප්‍රකාශ වී ඇති බැවින් සංගීතවේදියාට තම නාද රිද්ම පරිචය වඩාත් පුළුල් ලෙස නිරායාසයෙන් ආදේශ කිරීමට ඉඩ ලබා දීමේ විභවය, නිර්මාණ සියල්ලකම පාහේ මැනැවින් අන්තර්ගත වී පවතී. එයට අමතරව යම් තැනෙක තනුවක් සඳහා ලියූ පද රචනයක් පැවතිය හැකි වුවද එවැනි අවස්ථාවකද මෙම රචනාවලින් ප්‍රකට වන ප්‍රතිභාව නොමඳව පවතින බවද සඳහන් කළ යුතුයි.

**ඉහත කරුණුවලට අනුව**

විවිධ විරිත් ආභාසයෙන් නිර්මිත ගායනෝචිත රිද්මද කාව්‍යාලංකාර ආදියෙහි ප්‍රභාවද උපයෝගී කොට ගනිමින් තේමාව උද්දීපනය වන පරිදි රසාත්මක වැකි නිර්මාණයෙහි පරිචය,

ආකර්ශනීය පද නිර්මාණ හා පද සංකලන රටා මගින් අනුභූති ප්‍රබලව ප්‍රතිනිර්මාණය කිරීමේ හුරුබුහුටි බව,

තේමාව විචිත්‍රවත් කිරීම පිණිස පුළුල් පරාසයක විහිදුණු සමාජ සංස්කෘතික අත්දැකීම් සමුදායක් සියුම්ව ස්පර්ශ කිරීමෙන් ලද ව්‍යුත්පත්තිය අර්ථ පූර්ණ හා රස පූර්ණ ගේය පද බවට පත් කිරීමේ ප්‍රතිභාව

යන කරුණු මෙම ගේය පද සංග්‍රහයෙන් කැපී පෙනෙන පරිදි ප්‍රකට වෙනවා.

ඒ අනුව

2022 වසරේ විශිෂ්ටතම ගේය පද සංග්‍රහයට හිමි විදෙයා්දය සාහිත්‍ය සම්මානය හිමි කර ගන්නේ

කර්තෘ ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශිත **වසන්ත කුමාර කොබවක රචනා කළ - පමා වී පිපුණු මල් සුවඳයි කෘතියයි.**


ආචාර්ය ප්‍රියන්ත තිලකසිරි

සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේද අධ්‍යයනාංශය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය